ලිංගික අපරාධයකට ගොදුරු වූවෙකුගේ අනන්‍යතාවය හෙළි නොකරන ලෙසින්, ඔවුන්ගේ ඡායාරූප පළ නොකරන ලෙසින් ලොව පුරා සම්මුතීන් ලෙසින් පිළිගැනෙනා මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශනයන් මගින් මාධ්‍යවේදීන් හට උපදෙස් ලබාදේ.

ලිංගික අපරාධයට ලක්වූ වින්දිතයා මරණයට පත්ව ඇති මෙවන් අවස්ථාවකදී වුවත්, ඡායාරූපය මාධ්‍ය ඔස්සේ ප්‍රකාශ කිරීම මගින්, වින්දිතයාගේ පවුලේ අයවලුන් සිත්වේදනාවට ලක් නොවනු ඇතිද? වින්දිතයාගේ ඡායාරූපය ප්‍රකාශයට පත් නොකිරීමෙන්, ලිපියේ අන්තර්ගතයට සහ අරමුණට සෘජු හානියක් වන්නේද? එසේ නොවේ නම්, වින්දිතයාගේ ඡායාරූපය ප්‍රකාශයට පත් නොකළ යුතු නොවේද?

එසේම කිලිටි වූයේය යන අදහස දෙන දූෂණය/කෙළෙසීම වැනි යෙදුම් වෙනුවට ලිංගික අපරාධය/ලිංගික අපයෝජනය යන යෙදුම් වඩාත් යෝග්‍ය වන බවද දක්වමු.

මූලාශ්‍ර:
https://www.ipso.co.uk/member-publishers/guidance-for-journalists-and-editors/guidance-on-reporting-of-sexual-offences/
https://www.unicef.org/afghanistan/sites/unicef.org.afghanistan/files/2018-03/afg-publication_UN%20Ethical%20Guidelines%20for%20Journalists%20-%20English.pdf

#MediaEthicsSL #lka #SinhalaPress #News #Divaina